# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1990 අංක 34 දරන වාරිමාර්ග (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 සැප්තැම්බර් මස 06 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1990 සැප්තැම්බර් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

---

*කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : ශත 30 යි.** **තැපැල් ගාස්තුව : රු. 1.00 යි.**

## 1990 අංක 34 දරන වාරිමාර්ග (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 සැප්තැම්බර් මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 67/87

**වාරිමාර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1990 අංක 34 දරන වාරිමාර්ග (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**කෙටි නාමය.**

**2.** මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන වාරිමාර්ග ආඥාපනතෙහි 1968 අංක 48 දරන පනත මගින් ඇතුළත් කරනු ලැබ, 1983 අංක 23 දරන පනත මගින් සංශෝධිත 78අ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "මහෙස්ත්‍රාත් අධිකරණයට" යන වචන වෙනුවට "චූලායවන අධිකරණයට" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**458 වන** අධිකාරයේ 78අ වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ "දිසාපතිවරයා" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

' "දිසාපතිවරයා" යන්නට, අතිරේක දිසාපතිවරයෙක්, උප දිසාපතිවරයෙක්, පළාත් සභාවක අමාත්‍ය මණ්ඩලයේ වාරිමාර්ග විෂයය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරයා සහ පළාත් සභාවක ප්‍රාදේශිය ලේකම්වරයෙක් ඇතුළත් වේ; '.

ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.